© [සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved.]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016
## අවසාන පරීක්ෂණය - 2017

| PE0180/PE780 | ඉගැන්වීමේ ශිල්ප ක්‍රම<br>TEACHING TECHNIQUES |
|---|---|

2017.03.05 පැය 1300 - පැය1600 කාලය - පැය තුනයි.

*උපදෙස් :-*

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසේ "අ" කොටසින් **එක්** ප්‍රශ්නයක් ද "ආ" කොටසින් ප්‍රශ්න **හතරක්** ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- II කොටසේ පිළිතුරු පත්‍රය, I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.
- II කොටසේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු නව පිටුවකින් අරඹන්න.

විභාග අංකය:..............................................

### I කොටස

**වඩාත්ම ගැළපෙන වරණයේ අංකය තෝරා එය දී ඇති වරහන තුළ ලියන්න.**

01. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ මූලික සංකල්ප පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. උගන්වන්නේ කුමක් සඳහා ද යන්න ඉගැන්වීම් ක්‍රමවලින් අවධාරණය කරයි
    2. ඉගැන්වීමේ අනුපිළිවෙළ කෙසේ ද යන්න ඉගැන්වීමේ පටිපාටියෙන් අවධාරණය කරයි
    3. උගන්වන්නේ කවුරුන් විසින් ද යන්න ඉගැන්වීමේ ප්‍රවේශයෙන් අවධාරණය කරයි
    4. ඉගැන්වීමේ දී කුමක් උපයෝගී කර ගන්නේ ද යන්න ඉගැන්වීමේ ක්‍රමශිල්ප හා සම්පත්වලින් අවධාරණය කරයි (..........)

02. සංඥා එළි, පදිකයින්, පොලිස් නිලධාරීන් සඳහා සිසුන් යොදා ගනිමින් මාර්ගයේ ගමන් කිරීම පිළිබඳ ව අත්දැකීම් ලබා දීමට ගුරුවරයකු ක්‍රියා කර ඇත. මෙම ඉගෙනුම් අවස්ථාව හැඳින්වීමට වඩාත් යෝග්‍ය යෙදුම වන්නේ,
    1. ප්‍රදර්ශන ඉගෙනුම් අවස්ථාවකි.
    2. කණ්ඩායම් ක්‍රියාකාරකමකි
    3. සමරූපන ඉගෙනුම් අවස්ථාවකි
    4. ගැටලු විසඳීමේ ඉගෙනුම් අවස්ථාවකි (..........)

අ.පි.බ.

03. "A" නමැති පාසලේ 10 ශ්‍රේණියේ සමාන්තර පන්ති හතරක් ඇත. එහි විද්‍යාව විෂයය උගන්වන ගුරුවරු තිදෙනෙකි. ඔවුහු පිළිවෙලින් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිධාරීහු ය. උසස් පෙළ පන්තිවල කාලසටහන් ලබා දෙන ලෙස ඔවුන් ඉල්ලා සිටිය ද එය ඉටු කළ නොහැකිව ඇත. මෙම තත්ත්වය යටතේ සිසුන්ට වඩාත් ඵලදායී ඉගෙනුම් අවස්ථා ලබා දීමට යොදා ගත හැකි ඉගෙනුම් ක්‍රමය ලෙස ඔබ යෝජනා කරන්නේ,

1. බහු ශ්‍රේණි ඉගැන්වීම යි
2. සමූහ ඉගැන්වීම යි
3. බහුතල ඉගැන්වීම යි
4. කණ්ඩායම් ක්‍රමය යි (.........)

- පහත සඳහන් වගුවේ තොරතුරු පදනම් කර ගනිමින් 04 හා 05 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - ව්‍යාපෘති පාදක ඉගෙනුම | B - ප්‍රතිකාර්ය ඉගෙනුම |
| C - සාකච්ඡා ක්‍රමය | D - සහයෝගී ඉගෙනුම |
| E - සමරූපනය | F - දේශන ක්‍රමය |
| G - ප්‍රදර්ශන ක්‍රමය | H - ගැටලු පාදක ඉගෙනුම |

04. ඉහත වගුවේ සඳහන් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ADF
2. BEF
3. ADH
4. CDE (.........)

05. ඉහත වගුවේ සඳහන් ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ABC
2. CFG
3. FGH
4. EFH (.........)

06. සිසුන් ස්වාධීන චින්තනයට පොළඹවන බුද්ධි කලම්බනය ශිල්පක්‍රමය භාවිතය සඳහා වඩාත් ගැලපෙන අවස්ථාව වන්නේ,

1. පාඩම ආරම්භයේ දී
2. ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී
3. සිසුන්ගේ අවධානය ලබා ගැනීමේ දී
4. පාඩම සාර්ථක ව අවසන් කිරීමේ දී (.........)

07. ව්‍යාපෘති පාදක ඉගෙනුම් අවස්ථා (Project Based Learning) සඳහා යොදා ගත හැකි විවිධ වර්ගයේ ව්‍යාපෘති "අ" තීරුවෙහි ද ඒවාට උදාහරණ "ආ" තීරුවෙහි ද දක්වා ඇත.

| "අ" | "ආ" |
|---|---|
| A - නිර්මාණාත්මක ව්‍යාපෘති | K - පරිසර දූෂණය අවම කිරීම |
| B - ආර්ථික ඵලදායීතා ව්‍යාපෘති | L - ප්‍රදර්ශනයක් පැවැත්වීම |
| C - අධ්‍යාපන වර්ගයේ ව්‍යාපෘති | M - කොළ කැඳ ව්‍යාපෘතිය |
| D - ගැටලු විසඳීමේ ව්‍යාපෘති | N - ක්ෂේත්‍ර චැඩසටහනක් ක්‍රියාත්මක කිරීම |

"අ" තීරුවේ දක්වා ඇති ව්‍යාපෘතිවලට අදාළ උදාහරණ "ආ" තීරුවේ පිළිවෙළින් දක්වා ඇති පිළිතුරු අතුරින් තෝරන්න.

1. NMLK
2. LMNK
3. KLMN
4. LNKM (.........)

අ.පි.බ.



CamScanner

08. ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අන්තර්ගත ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් අදාළ **නොවන** පිළිතුර තෝරන්න.

1. ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක බහුල ව භාවිත කළ යුතු ය
2. ශිෂ්‍යයාගේ වයසට, ශ්‍රේණියට, බුද්ධි මට්ටමට ගැලපෙන ලෙස තෝරා ගත යුතු ය
3. ඉගෙනුම්-ඉගැන්වීම් ආධාරක ළමයාට ආකර්ෂණීය සහ ඉගෙනුමට පොළඹ වන සුළු ඒවා විය යුතු ය
4. පාඩමට, විෂය අන්තර්ගතයට ගැලපෙන ලෙස සකස් කළ යුතු ය (..........)

09. ඩෙංගු උවදුර තුරන් කිරීම මැයෙන් ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන පාඩමක දී ගුරුවරයා විසින් ගැටලු විසඳීමේ ක්‍රමය යොදා ගනිමින් සිසුන්ට ඵලදායී ලෙස අත්දැකීම් ලබා දෙන ලදී. ඔහු විසින් එම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමයේ දී අනුගමනය කරන ලද පියවර අනුපිළිවෙළින් නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. ගැටලුව නිශ්චය කිරීම → තාවකාලික උපකල්පන ඇති කර ගැනීම → දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය → නිගමන → නිගමන පරීක්ෂා කිරීම
2. ගැටලුව නිර්වචනය කිරීම → දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය → තාවකාලික උපකල්පන ඇති කර ගැනීම → නිගමන පරීක්ෂා කිරීම → නිගමන
3. තාවකාලික උපකල්පන ඇති කර ගැනීම → ගැටලුව නිර්වචනය කිරීම → දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය → නිගමන පරීක්ෂා කිරීම → නිගමන
4. දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය → තාවකාලික උපකල්පන ඇති කර ගැනීම → ගැටලුව නිර්වචනය කිරීම → නිගමන → නිගමන පරීක්ෂා කිරීම (..........)

10. ගුරුවරුන් අධික ලෙස නිවාඩු ගෙන ඇත. පාසලේ පන්ති කාමරවලට ප්‍රමාණවත් ගුරුවරුන් නොමැත. භෞතික සම්පත් අවම මට්ටමක පවතී. ඇතැම් විෂයයන් ඉගැන්වීමට ගුරුවරුන් නොමැත. මෙවැනි ගැටලු සහිත පාසලකට වඩාත් යෝග්‍ය ඉගැන්වීම් ක්‍රමය ලෙස ඔබ යෝජනා කරන්නේ,

1. සමූහ ඉගැන්වීම
2. බහු ශ්‍රේණි ඉගැන්වීම
3. බහුතල ඉගැන්වීම
4. කණ්ඩායම් ඉගැන්වීම (..........)

11. ස්කිනර්ගේ ප්‍රකාරක ආරෝපණ න්‍යාය පදනම් කර ගනිමින් සකස් ව ඇති පියවර පාඩම් ක්‍රමය යොදා ගැනීමේ දී නවක ගුරුවරයකුට ඔබ ඉදිරිපත් කරන වඩාත් නිවැරදි උපදේශනය වන්නේ,

1. ශිෂ්‍යයින්ට ඉගෙනුම් අවස්ථා සැලසුම් කර ගැනීමට අවස්ථාව දීමට යොමු කිරීම යි
2. කුඩා කණ්ඩායම් වශයෙන් වගකීම් පවරා අවශ්‍ය සටහන් ලබා දී නිදහස් ඉගෙනුමට යොමු කිරීම යි
3. සරලත්වයේ සිට සංකීර්ණත්වයට යන පරිදි පුද්ගල දක්ෂතාවලට ගැලපෙන ස්වයං ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීමට උපදෙස් දීම යි
4. මිශ්‍ර කණ්ඩායම් සකස් කොට කණ්ඩායම් තුළ ස්වයං ඉගෙනුමෙහි යෙදීමට පැවරුම් ලබා දෙන ලෙස උපදෙස් දීම යි (..........)

අ.පි.බ.



CamScanner

12. නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමේ දී විෂය අරමුණු, ඉගෙනුම් පල සමඟ ගලපමින් සිසුන් ක්‍රියාකාරී කිරීම තුළින් ............ ............ ............ යන ශක්තීන් සමෝධාන ව ගැලපීම සිදු වේ. මෙම ප්‍රකාශයේ හිස්තැන් තුන සම්පූර්ණ කිරීමට වඩාත් උචිත යෙදුම් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,

1. දැනුම, ලැදියා, අවශ්‍යතා
2. අනුකරණය, දැනුම, සතුට
3. ඉගෙනුම, ලැදියා, විනෝදය
4. සතුට, විනෝදය, ඉගෙනුම (.......)

13. **හේතුව** - ඕනෑම ආකාරයක මානව හෝ සමාජයීය අන්තර් ක්‍රියාවක් සඳහා ප්‍රශ්නකරණය වැදගත් සාධකයකි.

**නිගමනය** - තමා ඉගෙන ගත් දෙය පැහැදිලි කර ගැනීමට මෙන් ම නිවැරදි ව ඉගෙනුම් කාර්යයේ යෙදීමට ශිෂ්‍යයාට මග පෙන්වයි.

ප්‍රශ්නකරණ ශිල්පක්‍රමයට අදාළ ව දක්වා ඇති ඉහත හේතුව හා නිගමනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි කරයි
2. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි නොකරයි
3. හේතුව සහ නිගමනය එකඟතාවක් දක්වන අතර ඒ දෙක අතර සම්බන්ධතාවක් නැත
4. හේතුව සහ නිගමනය දෙක ම වැරදි ය (.......)

14. A - ගැටලු විසඳීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය උපයෝගී කර ගැනීම

B - ස්වයං මෙහෙයුම් ඉගෙනුම් කුසලතා වර්ධනය

C - කණ්ඩායම් තුළ තනි තනි ව ක්‍රියාකාරකම්වල යෙදීම

D - ගුරුවරයා විසින් සැලසුම් කර දීම

E - රසායනාගාර පර්යේෂණ කිරීම

ඉහත දක්වා ඇති කරුණුවලින් ගැටලු පාදක ඉගෙනීම (Problem Based Learning) අර්ථවත් කරන කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. ABC
2. BCD
3. CDE
4. DEA (.......)

15. "කොයිතරම් සූදානම් ව ගොස් ඉගැන්වුව ද සිසුන්ට කිසිවක් මතකයේ නොරැඳේ. මට දැන් මේ රැකියාවේ යෙදීම බෙහෙවින් අප්‍රසන්නජනක යි" - *ගුරුවරයකුගේ ප්‍රකාශයකි.*

ඉගැන්වීම පිළිබඳ ව දැඩි ලෙස කලකිරීමට පත් ව ඇති මෙම ගුරුවරයා වෙනුවෙන් විදුහල්පතිවරයකුට ගත හැකි පලදායී විසඳුම වන්නේ,

1. ගුරු භවතා වෙනත් පාසලකට මාරු කර යැවීම යි
2. පන්ති කාමර ඉගැන්වීමෙන් තාවකාලික ව ඉවත් කර පුස්තකාලය භාරදීම යි
3. ගුරුවරයාගේ කලකිරීම නැති කිරීමට ඔහු සමඟ සාකච්ඡා කර අවවාද කිරීම යි
4. පාසල් පාදක ගුරු සංවර්ධනය ක්‍රියාකාරකම් උපයෝගී කර ගනිමින් ඔහුගේ ගුරු කුසලතා සංවර්ධනයට අවස්ථාව ලබාදීම යි (.......)

අ.පි.බ.

16. පහත දක්වා ඇති හේතුව සහ නිගමනය කියවා ඒ දෙක අතර ඇති සම්බන්ධතාව වඩාත් හොඳින් නිරූපණය කරන පිළිතුර තෝරන්න.

**හේතුව** - ගුරුවරයා විසින් ගැටලු අවස්ථා සැලසුම් කොට ඒ සඳහා විසඳුම් සෙවීමට උදව් වන ඉඟි හා මගපෙන්වීම් ලබාදීම මගපෙන්වන ලද අනාවරණ ක්‍රමයේ දී වැදගත් වේ.

**නිගමනය** - තමා ඉගෙන ගත් දේ මැනවින් අවධාරණය වීමට, මතක තබා ගැනීමට මෙන් ම උසස් මානසික හැකියා දියුණු කර ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව සැලසේ.

1. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි කරයි
2. හේතුව සහ නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි නොකරයි
3. හේතුව සහ නිගමනය එකඟතාවක් දක්වන අතර ඒ දෙක අතර සම්බන්ධතාවක් නැත
4. හේතුව සහ නිගමනය දෙක ම අසත්‍ය ය (______)

17. ගුරු අධ්‍යාපන ගැටලුවලට විසඳුමක් වශයෙන් ගුරුවරයා සුසාධ්‍යකාරකයකු (Facilitator) විය යුතු බව අවධාරණය කළ ද බොහෝ ගුරුවරුන් ද්විතීයික පන්තිවලට ඉගැන්වීමේ දී දේශන ක්‍රමය බහුල ව යොදා ගන්නා බවත්, වැඩි විෂය කරුණු ප්‍රමාණයක් වැඩි පිරිසකට එමඟින් ඉගැන්විය හැකි බවටත් ඔවුන් ප්‍රතිචාර දක්වන බව පර්යේෂණ අනාවරණ මගින් පැහැදිලි වී ඇත. එවැනි ගුරුවරුන්ට දේශන ක්‍රමයේ ඇති දුර්වලතා අවම කර ගැනීම සඳහා ඔබ යෝජනා කරන වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගයන් වන්නේ,

1. සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදවීම, ශිෂ්‍ය අදහස් ලබා ගැනීම සහ ඉගෙනුම් ආධාරක භාවිතය
2. ඉගෙනුම් ආධාරක භාවිතය, සටහන් ලබා දීම, පරීක්ෂණ පැවැත්වීම
3. පරීක්ෂණ පැවැත්වීම, ශිෂ්‍ය අදහස් ලබා ගැනීම, අත්පත්‍රිකා ලබා දීම
4. සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදවීම, සටහන් ලබා දීම, කේවල අභ්‍යාස ලබා දීම

(______)

18. ජලාශයක් නිරීක්ෂණය කර එහි ජීවීන් පිළිබඳ අත්දැකීම් සිසුන්ට ලබා දීමට ක්‍රියා කළ විද්‍යාව ගුරුවරයාගේ අදහස වූයේ තමා අපේක්ෂා කළ ප්‍රතිඵලය ඉන් නොලද බවත්, මින්පසු කිසිදිනෙක එවැනි ක්‍රියාකාරකම් සංවිධානය නොකරන බවත් ය. පාසලේ විද්‍යා අංශ ප්‍රධානී ලෙස මෙම ගැටලු තත්ත්වයට හේතු අනාවරණය කර ගැනීමට ඔබ යොදා ගනු ලබන වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය වන්නේ,

1. විෂයයේ නිපුණතා, නිපුණතා මට්ටම් හා පාඩමේ ඉගෙනුම් ඵල පරීක්ෂා කිරීම යි
2. අධ්‍යයනයේ දී දෙන ලද පැවරුම්/ක්‍රියාකාරකම් හා ශිෂ්‍ය සංඛ්‍යාව සොයා බැලීම යි
3. ඉගෙනුමට පෙර, ඉගෙනුම් අවස්ථා තුළ දී හා ඉගෙනුම් අවස්ථාවෙන් පසු ගුරුවරයාගේ කාර්යයන් හා සැලසුම් පිළිබඳ ව සලකා බැලීම යි
4. ඉගෙනුම් කාර්යය සඳහා යොදා ගන්නා ස්ථානය හා වේලාව පරීක්ෂා කිරීම යි. (______)

අ.පි.බ.



CamScanner

19. 2015 සිට ද්විතීයික ශ්‍රේණිවල ගුරුමාර්ගෝපදේශ සංග්‍රහවල සුවිශේෂ අරමුණු වෙනුවට ඉගෙනුම් පල ඉලක්ක කර ගනිමින් විෂය සැලසුම් සකස් කර ඇත. පාඩමක් සඳහා ඉගෙනුම් පල ලිවීමේ දී අනුගමනය කළ යුතු වඩාත් නිවැරදි ක්‍රමය වන්නේ,

1. ඉගෙනුම් පල ක්ෂේත්‍රවලට වෙන් කර ලිවීම යි
2. ✓ ඉගෙනුම් පල ලිවිය යුතු අතර ක්ෂේත්‍රවලට වෙන් කිරීම අවශ්‍ය නොවේ
3. පාඩමේ පියවරින් පියවරට ඉගෙනුම් පල ලිවිය යුතු ය
4. ඉගෙනුම් පල ලිවීමේ දී ආවේදන ක්ෂේත්‍රයට වැඩි බරක් ලබා දිය යුතු ය (..............)

20. **හේතුව** - යම්කිසි විෂයයක් ඉගැන්වීමේ දී විෂය අරමුණු ජාතික අරමුණු සමඟ සම්බන්ධ වන ආකාරය හා විෂයයේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම අවශ්‍ය ය.

**නිගමනය** - තම විෂයය ශිෂ්‍යයන්ට ගැලපෙන අයුරින් තිරස් හා සිරස් සබඳතාවන් ආරක්ෂා කරමින් ක්‍රියාත්මක කිරීමෙහි ලා ගුරුවරයාට මගපෙන්වයි.

හේතුව හා නිගමනය අතර සබඳතාව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. හේතුව හා නිගමනය අතර සම්බන්ධතාවක් නැත
2. හේතුව හා නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි කරයි
3. හේතුව හා නිගමනය සත්‍ය වන අතර නිගමනයෙන් හේතුව පැහැදිලි නොකරයි
4. හේතුව සහ නිගමනය දෙක ම අසත්‍ය වේ (..............)

(ලකුණු 01 x 20 = ලකුණු 20යි)

* Answers - for paper I

| | | | |
|---|---|---|---|
| (1) | 2 | (11) | 3 |
| (2) | 3 | (12) | 4 |
| (3) | 2 | (13) | 1 |
| (4) | 3 | (14) | 1 |
| (5) | 2 | (15) | 4 |
| (6) | 1 | (16) | 1 |
| (7) | 2 | (17) | 1 |
| (8) | 1 | (18) | 3 |
| (9) | 1 | (19) | 2 |
| (10) | 2 | (20) | 2. |

Total Marks - 20.



CS CamScanner